# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2386/20 - 2024 මැයි 31 වැනි සිකුරාදා - 2024.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

### හිමිකම් ලියාපදිංචි කිරීම

**1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත**

14 වැනි වගන්තිය යටතේ හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්ගේ තීරණ ප්‍රකාශය

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ රත්ගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 45- මහ හැගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මහ හැගොඩ නමැති ගමේ පිහිටියා වූ ද, අංක 810140 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 1 හි කැබලි අංක 1 : 10 සහ 1 : 70 දරන ඉඩම් කොටස් ලෙස පෙන්නුම් කොට ඇත්තා වූ ද, හිමිකම් පෑම් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙමින් 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාර 2022.10.06 වැනි දින අංක 2300/26 දරන *ගැසට් පත්‍රයේ* යථා පරිදි පළකරන ලද අංක 81/0269 දරන දැන්වීමේ සඳහන් කොට ඇත්තා වූ ද, ඉඩම් කොටස්වල අයිතිය සම්බන්ධයෙන් මෙහි උපලේඛනයේ දැක්වෙන මාගේ තීරණ 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වැනි වගන්තියෙන් පහත අත්සන් කරන මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, මම මෙයින් ප්‍රකාශ කරමි.

**පී. සී. ඩී. සිල්වා,**
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්.

2024 මැයි මස 08 වැනි දින,
බත්තරමුල්ල,
රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර", අංක 1200/6,
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.

1A - G 41988 - 04 (2024/05)

*සැ.යු.- මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

උපලේඛනය

| *පත්‍ර අංකය සහ කොටසේ අංකය* | *ඉඩම් විශාලත්වය* | *අයිතිකරුගේ/අයිතිකරුවන්ගේ සම්පූර්ණ නම/නම් සහ ලිපිනය* | *ජාතික හැඳුනුම්පත් අංකය* | *අයිති ඉඩමේ ප්‍රමාණය* | *අයිතියේ පන්තිය සහ ස්වභාවය* | *විනිශ්චයන් සහ ඉන්ජෙන්ෂන් තහනම් අපේක්ෂාවෙන් ඇති උකස් සහ බැඳීම් පිළිබඳ විස්තර* | *යම් විශේෂ හෝ පෞද්ගලික නීතියකට යටත් නම් ඒ පිළිබඳ විස්තර* |
|---|---|---|---|---|---|---|---|
| | *(හෙක්ටයාර්)* | | | | | | |
| 1:10 | 0.0061 | පුද්ගලික | | සම්පූර්ණ | ප්‍රථම පන්තිය | _ | කැබලි අංක 1:8, 1:9 ට ප්‍රවේශ වීම සඳහා |
| 1:70 | 0.0032 | පුද්ගලික | | සම්පූර්ණ | ප්‍රථම පන්තිය | _ | කැබලි අංක 1:69 ට ප්‍රවේශ වීම සඳහා |

EOG 05-0187

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.